


# පිරිමියාගේ විරහ ගීය

පිරිමියකුගේ විරහ ගීතයක හැම විටම ව්‍යාජයක් ඇතුල් වෙනව. පිරිමියෙකුට වෙන්වීම නිතැතින්ම ඇති වන දෙයක් නිසා. මනුස්සයා ඇති වුන මුල් අවදියේ ඉඳල පිරිමියා හිටියේ කංඩායම් වැදිල නිජබිම රැකීමට සැරසරමින්. අද තිබෙණ යුගල පවුල එදා තිබුණෝ නෑ. ඇත්තටම යුගල පවුලත් යුග දිවියත් මේ මෑතකදී ඇති වුන ආයතනයක්. නූතන වෙළඳ සමාජය තුල හැම මිනිසෙක් ම, ගෑනු පිරිමි බේදයෙන් තොරව පවුලෙන් කඩල තනි ඒකක බවට පත් කරණව. ඒ අනුව ආදරය හා විවාහය දෙදෙනෙකුට හුගක් සීමා වෙනව. ඇත්තට ම දේපොල හිමි ලොකු පවුල් ඇරුනාම සාමාන්‍ය පවුල් වල යුග දිවිය හුගාක් ම පුද්ගලික දෙයක්. මෙය නිදහසක් වුනත් තනි පවුල එක් අතකින් අසරණ විමක්. විශේෂයෙන් ම ගැහැණියට එය අන්තරායදායක ගමණක්. සමා- ජයේ සරණ නැත්නම් තනිවූ ගැහැණියකට ලොකු අමාරුවකට මුහුණ දෙන්න සිදු වෙනව. වෙළඳ පොල ධනපති ආර්ථිකය තුලින් තමා යුගල ප්‍රේමය හිනිපෙත්තට නැග්ගෙ කියල කියන්න පුළුවන්. ඒත් ඇත්තට ම එය වෙළඳ ගණුදෙනුවක් කියල එළියට ගෙනත් නෑ. අමාරු කාල වල දී තමා මේකෙ ඇත්ත නැත්ත එළිවෙන්නේ.

කොහොමටත් අදට වඩා පවුල් වල බලපෑම් වැඩි, ගම් වල හිරවෙලා හිටිය යුගයේ දී ආදරය තියෙන්නේ ගැහැණියට. පිරිමියාට වෙන්වීම ගැන වේදනාවක් ඒ තරමට ගොඩ නැගෙන්න බෑ. ඇත්ත තමයි තමා කැමැති ගැහැණිය විවිද හේතු තුල ලබා ගැන්මට නොහැකි වීම පිරිමි විරහ ගීතයකට මග පාදන්න පුළුවන්.
"....එන්න මදනලේ ගොස් පවසන්න දුක මගේ..." යන ගීතයට සමාජ තේරුමක් තියෙනව. ඒ එක්කම පෙම්වතිය, බිරිඳ මැරුණ විටක වියෝ ගීයක් මතුවෙන්න පුළුවන්.
"....සෝබන චන්ද්‍රා නැග එනවා, චන්ද්‍රාවෝ ඔබ සිහි- වෙනවා...." ඒ වගේ විරහ පිරිමි ගීතයක්.



දන්නකියන අය අතර ඇති වන අළුත් වීමක් විතරයි. නොදන්න ආගන්තුකයන් සමඟ එකතු වන අපූරු විශ්මය ජනක ආදරය සාමාන්‍ය දෙයක් නොවෙයි. ඒක අපූරුවට හැඳුන උසස් පවුල් වලට සීමාවුන අමුතු කතාවක්. නැත්නම් තියෙන්නේ තමන් කුඩා කල සිට ඇසුරු කල ඥාති පෙම්වතා වෙන ගමකට යන විට ගැහැනියට ඇති වන වේදනාව ගැන කතන්දර යි. එක්කෝ යුද්දයට යනව නැත්නම් වෙළඳ කණ්ඩායමක් එක්ක යනව. මේ වගේ වෙලාවට ගමක ඇති වෙන වියෝව තමයි සාමාන්‍ය තරුණ ජීවිත වලට එදා බලපෑවේ.

පිරිමියාට , මිනිස් සමාජයේ මුල් කාලයේ දී තනි ගැහැණියකට දිගටම යන සම්බන්ධයක් ඇති කරගන්ට උවමනාවක් තිබුණෙ නෑ. මොකද එහි දිගට යන සම්බන්ධතා කොහොමටත් තිබුණෙ නැති නිසා. ඒත් ගැහැණයකට තම දරුවාට ලොකු බැඳීමක් තියෙනව. අම්මාගෙන් දරුවට වගේම දරු- වාගෙන් අම්මාට බැඳීමක් තියෙනව. ඒත් පියෙකුට දරුවට බැඳුමක් තිබෙන්න තරමට එදා දරුවන් පියා ගැන දැනගෙන හිටියේ නෑ. පියාගේ හා දරුවන්ගේ සම්බන්ධය තහවුරු වුනේ යුගල පවුල තුල විතරයි. ඒ නිසා භෞතිකව බැළුවහම පෙනෙනව පිරිමියාට තිබුණෙ තම මවගේ පවුලට තිබුණ බැඳුම විතරයි කියන එක. තම ගෝත්‍රයට බැඳීමක් හැටියටයි එය වර්ධනය වුනේ. ඒ නිසා පිරිමියා ගෝත්‍රවාදියෙක් විනා දරු පවුල්වාදියෙක් නොවෙයි. ගැහැණිය දරු පවුල්වාදියෙක්. ගැහැණියගේ බැම්ම එදිනෙදා සියළු වැඩකටයුතු වලට බැඳුන සංයුක්ත ආදර බැම්මක්. පිරිමියාගේ බැම්ම විඥානවාදී ගෝත්‍ර බැම්මක්. මේ දෙකෙන් එකක් අනිත් එකට වඩා ගැඹුරුයි කියල මන් කියන්නේ නෑ. මොකද දරුවන් වෙනුවෙන් අම්මා කෙනෙක් කරණ දේට වඩා අතිමහත් දරුණු හා වීර වැඩ පිරිමි තම ගෝත්‍රය වෙනුවෙන් කරණ නිසා මේව සසඳන්න බෑ.

ධනවත් වෙළඳ සමාජය තුල පිරමියා ඒ ගෝත්‍රවාදී සිතුම් වලින් ඈත් කරල පුද්ගල පවුලට යට කරල තියෙනව. ඒ අනුව කාන්තාවගේ බලපෑම් වැඩිවුනා කියල කියන්න පුළුවන්. ඒත් පුද්ගල පවුල තුලින් ගැහැණිය තුළ පවතින අම්මාට, සොයුරන්ට ඇති සදාතනික බැම්ම බිඳ වැටෙනව. එයට හරියාකාර විකල්පයක් නෑ. කාන්තා සහෝදරත්වය නැතිවීම මේ විදියට බැළුවහම මහ විපතක් කියල කියන්න පුළුවන්. මේ විදියට වර්ධනය වන ධනපති සමාජය තුල තියෙන ආදරය ගැනයි දැන් අපට කතා කරන්න තියෙන්නේ. පැරණි ගම හා පවුල බිඳ වැටුන  නිසා ගැහැණියට තියෙණ ආරක්ෂාව බිඳ වැටිල. එනිසාම වෙන්වීමේ බියකරු සිහිනය ගැහැණියකගේ වියෝ ගී වල ඇත්ත අරුතක් තියෙනව වුනත් ඒ විදියටම පිරිමියාගේ විරහව ගැන හිතන්න බෑ. උදාහරණයක් වශයෙන් "...කොතැනක හෝ පිපිලා යලි ඔබට සුවද ගෙනෙන්නම්, කෙදිනක හෝ වැඩිලා යලි ඔබට සෙවන සදන්නම්......" යන ගීතය ගැහැණියකගේ ගීතයක් හැටියට ගත හැකි වුනත් එය පිරිමි ගීතයක් හැටියට සළකන්න බෑ. මොකද? එවැනි දෙයක් ගැහැණියක් වෙනුවෙන් කරණ ඇරයුමක් හැටියට පිලිගන්න අමාරු නිසා.

අනෙක් අතට "..මගෙ කඳුලින් නිමාවූ මාවතේ, ඔහු සමඟින් ඔබ මන්දහාසින් යන ගමනේ...." යන ගීය ඇත්ත ලෝකයේ පිරිමියකුට ගැයිය හැකි අවස්ථා මතු වෙනවද? සියළු දේ ලබා දෙන පිරිමියා අමතක කර දමා යන ගැහැණිය පිළිබඳ කතාව අපූරු සිද්ධියක් පමණයි. මනමේ ජාතකයේ කුමරාට පෙම් බැඳි නිසා නොව පියාගේ අණසකට යටත්ව ආ කුමරිය වනයේදී දුටු වැදි රජුට වසඟ වීම පිළිගත හැකියි. ආදරය නොසලකා බලය, ධනය යොදා පිරමියකු විසින් අත්කරගත් ගැහැණියක් ඔහු අත්හැර ප්‍රේමයක පැටලෙන කථා අහන්න පුළුවන්. ඒත් පෙම්බැඳි පිරිමියා අත්හැර දෙවන ලෝකයකට දරු පවුල දමා යන ගැහැණියකගේ කථාවක් අහන්න අපූරු සිද්ධියක්. ඒ නිසා පිරිමියාගේ විරහ ගීය අපූරු දෙයක් හැටියට මිස හැඟිම් කලඹන ගීතයක් ලෙසට මතු කරගන්න අමාරුයි.

■


## Tomorrows Migration Solutions Today...

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

Our team of Specialist Lawyers, Lawyers & Barristers in Melbourne competently assisted many Sri Lankans, many other nationalities and many Australian Companies in the following areas of Migration matters over the years and continue to do so:

- General Skill Migration Permanent Resident visas
- General Skill Migration Provisional Resident visas
- Second stage Skilled Regional (Permanent residence) visas
- Graduate Skill Temporary visas
- Complex Student visas
- 457 Visas
- Employer Nominations (ENS)
- Employer Contracts
- Negotiations of employer nominations with the Australian Employers
- Regional Sponsored Migration Scheme (RSMS)
- Skill Assessments
- State Sponsorships
- TRA cancellations
- Criminal Prosecutions on TRA cancellations
- Student Visa Cancellations
- Permanent residence Cancelations
- Appeals to the Migration Review Tribunal (MRT) or Administrative Tribunal (AAT)
- Business Migration State Sponsorships
- First and Second Stage Business Migration visas
- Spouse & visas
- Aged Parent visas
- Aged Dependent Parent visas
- Contributory Parent visas
- Resident Return visas
- Australian Citizenships

***Our Team of Lawyers:***

**Don Susantha Katugampala** LL B (Monash)
MARN: 9601070
Accredited Immigration Law Specialist
Principal Lawyer – Fairfields Lawyers

**Michael Gros** LL B (Monash)
MARN: 9803398
Consulting Barrister

**Frank Sabelberg** LL B (Monash)
MARN: 0004726
Consulting Solicitor

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

10 Morrison Place East Melbourne VIC 3002
T | 03 9650 4557 F | 03 9650 4559
info@fairfieldslawyers@com.au

***We Deliver Results...***